බාලවයස් දැරියක් පුද්ගලයෙකු විසින් ලිංගික අපයෝජනයට ලක් කිරීමේ සිදුවීමක්, අරුණ පුවත් වාර්තාවක් ඔස්සේ දැක්වී ඇති ආකාරය මෙසේය.

අරුණ (දෙසැම්බර් 07, 2022) - "14 සිසුවිය සැප රියක දාගෙන වරින්වර කෙලෙසලා" (බාලවයස්කාරිය ලිංගික අතවරයට ලක් කළ බව පුවත් අන්තර්ගතයේ සඳහන් වේ.)

ඔබ දකින ආකාරයට,

1) ලිංගික අපරාධයන් දැක්වීමට "කෙලෙසීම" වැනි යෙදුමක් භාවිතා කිරීම කෙතරම් යෝග්‍ය ද?

2) ඒ ඔස්සේ, සිදුවීමට ලක් වූ අය අපවිත්‍ර වී ඇති බවක් ගම්‍ය නොවන්නේ ද? එය ලිංගික අපරාධයකට ලක් වූ අයෙකු පිළිබඳව සමාජය තුළ කොන් කිරීමක් ඇති කිරීමට ද රුකුලක් නොවන්නේ ද?

3) එසේ නම්, "ලිංගික අපයෝජනය", "ලිංගික අතවරය" වැනි යෙදුමක් වඩාත් උචිත නොවන්නේ ද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම් ඔබ දකිනා මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් මෙම Google පෝරමය (https://forms.gle/u5a5n5dJPDerh3Le7) පිරවීම මගින් අපිට එවන්න. නැතිනම් එම මාධ්‍ය ආචාර ධර්ම කඩකිරීම් අපගේ සමාජ මාධ්‍ය පර්යන්තයන් හරහා අප වෙත එවන්න.